# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,410 - 2024 නොවැම්බර් මස 08 වැනි සිකුරාදා - 2024.11.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස : අධිකරණ

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 470 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 නොවැම්බර් මස 14 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## පෙත්සම සම්බන්ධ දැන්වීමයි

### සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය

වර්ෂ 1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීති සමඟ කියවිය යුතු වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 272 වන වගන්තියට අනුකූලව කරනු ලබන ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීමක් සම්බන්ධ කාරණාවකදී ය.

නඩු අංකය : HC/CIVIL/71/2024/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්යය පටිපාටිය : ලඝු
වටිනාකම : රු. 36,016,297.74

නාරත ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 400, නුගපෙ.
උස්වැටකෙයියාව.

*සහ*

වර්ෂ 1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීති සමඟ කියවිය යුතු වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 272 වන වගන්තියට අනුකූලව කරනු ලබන ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීමක් සම්බන්ධ කාරණාවකදී ය.

**සී. බී. සී. ෆයිනෑන්ස් ලිමිටඩ්,**
අංක **187**, කටුගස්තොට පාර,
මහනුවර.

*..................පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වර්ෂ 2024 ක් වූ ඔක්තෝබර් මස 01 වන දිනැතිව මහනුවර, කටුගස්තොට පාරේ. අංක 187 දරන ස්ථානයේ පිහිටා ඇති සී. බී. සී. ෆයිනෑන්ස් ලිමිටඩ් යන සමාගම විසින් පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

තව ද, එකී පෙත්සම **වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 17 වන දින** ගරු අධිකරණයේ ඇසීම සඳහා යොමු කර ඇත. තව ද, එකී සමාගමේ මොනයම් හෝ ණයහිමියෙකු හෝ සහදායකයෙකු එකී පෙත්සම මත නියෝගයක් ලබා ගැනීම සඳහා සහාය වන්නේ හෝ විරුද්ධ වන්නේ නම්, නඩුව අසනු ලබන දිනයේ පුද්ගලිකව හෝ නීතිඥ සහාය ඇතිව ගරු අධිකරණයේ පෙනී සිටිය හැකිය. තව ද, පෙත්සමේ පිටපතක් එකී සමාගමේ මොනයම් හෝ ණයහිමියෙකු හෝ සහදායකයෙකු ඉල්ලා සිටින්නේ නම් නියමිත ගාස්තුවට යටත්ව එය සැපයනු ලැබේ.

ශිරන්ති ගුණවර්ධන ඇසෝසියේට්ස්,
අංක. 22/1, එලියට් පෙදෙස,
කොළඹ 08,
(පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ)

***සටහන.-*** එකී පෙත්සම අසනු ලබන දිනයේ පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන ඕනෑම අයෙකු ඒ සම්බන්ධව දන්වා ලිඛිත දැන්වීමක් ඉහත නම් සඳහන් සී. බී. සී. ෆයිනෑන්ස් ලිමිටඩ් වෙත භාර දීමට හෝ තැපැල් මාර්ගයෙන් ලැබීමට සැලැස්විය යුත්තේ ය. එකී දැන්වීමේ අදාල පුද්ගලයාගේ නම සහ ලිපිනය, හෝ ආයතනයක් නම්, ආයතනයේ නම සහ ලිපිනය සඳහන් කළ යුතු අතර, එකී පුද්ගලයා හෝ ආයතනය හෝ, ඔහුගේ හෝ ආයතනයේ නීතිඥවරයා (එවැන්නෙකු සිටී නම්) විසින් එකී දැන්වීම අත්සන් තැබිය යුතු අතර ඉහත නම් සඳහන් සී. බී. සී. ෆයිනෑන්ස් ලිමිටඩ් වෙත වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 16 වන දින ප. ව. 6.00 ට පෙර භාර දීම හෝ, ප්‍රමාණවත් කාලයක් ඇතුළත තැපැල් කිරීම කළ යුත්තේ ය.

11-144

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.